# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

ජනවාරි – මාර්තු 2018



තඹුත්තේගම දී පොලිසිය විරෝධතාකරුවෙකුට පහර දෙන අයුරු (වීඩියෝව අද දෙරණ https://www.youtube.com/watch?v=pDgrULUGEb8)


INFORM Human Rights Documentation Centre

www.ihrdc.wordpress.com informcolombo@gmail.com

ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය : ජනවාරි, 2018- මාර්තු, 2018
© ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය, 2018

කොළඹ ශ්‍රී ලංකාව

බ්ලොග් අඩවිය: https://ihrdc.wordpress.com/
ඊමේල් ලිපිනය: informcolombo@gmail.com

## ආවරණය කළ ප්‍රධාන මාතෘකා

**A.** කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට විරුද්ධ ප්‍රචණ්ඩත්වය

**B.** උතුරේ දමිළ ජනවාර්ගික ක්‍රියාකාරීන්ට තර්ජන සහ බාධා

**C.** ශිෂ්‍ය ක්‍රියාකාරීන් මර්දනය

**D.** ජනමාධ්‍යවේදීන්ට එරෙහි තර්ජන සහ බාධා කිරීම්

**E.** විරෝධතා මර්දනය

**F.** අනෙකුත් තර්ජන සහ බියවැද්දවීම්

**G.** සංවිධානය වීමේ නිදහස

ඉන්ෆෝම් 1990 දී පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ජනවාර්ගික අර්බුදය සහ යුද්ධය යන සන්දර්භයේදී මානව හිමිකම් තත්වය ගැන අධීක්ෂණය සහ ලේඛනගත කිරීමට මෙන්ම ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික තලයන්හිදී ලිඛිතව සහ වාචිකව එම තත්වය වාර්තා කිරීමටයි .එසේම ඉන්ෆෝම් සිය අයිතිවාසිකම් නිතර සහ ක්‍රමානුකූල ලෙස උල්ලංඝණය වෙන අනෙකුත් ප්‍රජාවන් සමග ද වැඩ කර ඇත .වර්තමානයේ, ඉන්ෆෝම් ඡන්ද නිරීක්ෂණය, ප්‍රකාශනයේ නිදහස සහ මානව හිමිකම් ක්‍රියාධරයන් ඉලක්ක කර ගනිමින් වැඩ කරයි .ශ්‍රී ලංකාවේ, කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයන්, කණ්ඩායම් සහ ජාල සමග මෙන්ම, කලාපීය) ආසියානු, සහ අන්තර්ජාතික මානව හිමිකම් ජාල සමග ද කිට්ටුවෙන් කටයුතු කරයි .

# අන්තර්ගතය

ක්‍රමවේදය ....3
සන්දර්භය සහ විධායක සාරාංශය....3
A කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය....5
1. මුලතිවු දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම....5
2. මොනරාගල දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම ....5
3. මඩකලපුව දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම....6
4. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවක ලිංගික අපයෝජනය කිරීම....6
5. ස්ත්‍රී ඡන්දදායකයාගේ ගෙදර ආක්‍රමණය කරයි....6
6. මුස්ලිම් කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට විරුද්ධව මවුලවිගේ වීඩියෝ ප්‍රකාශය ....6
8. කයිට්ස්වල ඉඩම් ගැන විරෝධතාවේ නියැලුනු දමිළ ජාතිකයන්ට නාවික හමුද බුද්ධි අංශ තර්ජනය කරයි....8
9. කේප්පාපුලාවු හි ඉඩම් අල්ලා ගෙන සිටීමට විරුද්ධව දෙමළ ජනතාව කළ විරෝධයට විරුද්ධව පොලිස් ක්‍රියාමාර්ග ....9
10. විරෝධතාවට සහභාගි වීමෙන් පසු උතුරු පළාත් සභා මන්ත්‍රී අත්අඩංගුවට ....9
C ශිෂ්‍ය ක්‍රියාකාරීන් මර්දනය ....10
11. නවකවද විරෝධී ශිෂ්‍යයන්ට පහරදීම....10
12. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ සහ දෙමාපියන්ගේ විරෝධතාවය විසුරුවා හැරේ....11
D ජනමාධ්‍යවේදීන්ට එරෙහි තර්ජන සහ බාධා....12
13. රූපවාහිනී ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට තර්ජන....12
14. අල් ජසීරා මාධ්‍යවේදී කණ්ඩායම හමුදව විසින් අවහිර කරයි....13
15. දෙමළ ජනමාධ්‍යවේදියාට යුද හමුද නිලධාරීන් හිරිහැර කරයි ....13
E විරෝධතා මර්දනය....15
16. අත් අඩංගුවේ සිටියදී පොලිසිය විරෝධකරුවන්ට පහර දුන්නා....15
17. විරෝධතාවයේ නියැලි ගොවීන් අත්අඩංගුවට....16
F. අනෙකුත් ආකාරයේ තර්ජන සහ බිය ගැන්වීම් ....17
18. ලන්ඩනයේ ශ්‍රී ලංකා මහලේකම් කාර්යාලයේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරියෙකුගේ තර්ජනාත්මක ඉගිය.17
19. මහේස්ත්‍රාත් උසාවිය තුළ නීතිඥවරියකට ප්‍රහාර....18
20. මහ ඇමැතිවරයාගේ අපයෝජනය හෙළිදරව් කළ විදුහල්පතිවරියට මරණ තර්ජන ....19
21. එච්අයිවී නිවාරණ ව්‍යාපෘතියට සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධාන සේවකයන්ට ප්‍රහාර ....19
G සංවිධානය වීමේ නිදහස.... 20
22. පවතින නීතියක් සංශෝධනය කර සංවිධානය වීමේ නිදහස සීමා කිරීමේ උත්සාහයන්.... 20

# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

**ක්‍රමවේදය**

2018 ජනවාරි -මාර්තු අතර කාලයේ ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය සම්බන්ධයෙන් වැදගත් සිද්ධි සහ සාමාන්‍ය රටාවන් සම්බන්ධ විස්තර මේ වාර්තාවෙන් සපයයි. විධායක සාරාංශයෙන් සන්දර්භය විස්තර කර, රටාවන් විශ්ලේෂණය කිරීම ද, අදාළ මාතෘකාව සම්බන්ධයෙන් රජය ඇතුළු අනෙකුත් සම්බන්ධ පාර්ශවවල චර්යාව ඇතුළුව පොදු සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සිදු කරයි. ඉන්පසු, සුවිශේෂී සිද්ධි 22ක්, මාතෘකා 7ක් යටතේ විස්තර කෙරේ. ඉන්ෆෝම් වෙත වාර්තා වූ සිද්ධි, ඉන්ෆෝම් කාර්ය මණ්ඩලයේ නිරීක්ෂණ සහ අත්දැකීම සහ මාධ්‍යවල වාර්තා වූ සිද්ධි මේ වාර්තාවට අදාළ තොරතුරු ලබා ගැනීමේ දී පදනම් ව ඇත.

**සන්දර්භය සහ විධායක සාරාංශය**

2018 ජනවාරි මාසයේ, ජනාධිපති සිරිසේන ඔහුගේ වසර 5ක නිල කාලයෙන් තුන්වැනි අවුරුද්ද සම්පූර්ණ කළේය. ඔහුගේ සහ අගමැති රනිල් වික්‍රමසිංහගේ ඡන්ද ව්‍යාපාරවලට බොහෝ අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ සමාජ ව්‍යාපාර සහයෝගය දුන්නේ වූ නමුත්, මානව හිමිකම් සම්බන්ධයෙන් ඇති වී ඇති ප්‍රගතිය 2018 වසරේ දී ද දිගින් දිගටම කනස්සලු සහගත වේ.

2018 පෙබරවාරි 10 වැනිද පැවැත්වුණු පළාත් පාලන මැතිවරණය 2018 වසරේ පළමු කාර්තුවේ සිදු වූ ප්‍රධාන සිද්ධිවලින් එකකි. මේ මැතිවරණයේ තිබූ වඩාත්ම ප්‍රගතිශීලී අංගය වූයේ කාන්තා අපේක්ෂකයන් සඳහා 25%ක කොටසක් හිමි වී තිබීමයි. කෙසේ වුවත් කණගාටුදායක කාරණය වූයේ එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකිරීමයි. කෙසේ වුවත්, වැඩිවුණු කාන්තා අපේක්ෂකයන් සම්බන්ධයෙන් පුළුල් ලෙස පැතිරුණු විරෝධයක් තිබුනු අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය දක්නට ලැබුනි. සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් කාන්තා මැතිවරණ අපේක්ෂකයන් භෞතික සහ වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩත්වය අත් වින්දහ. නමුත් සමාජ මාධ්‍ය ඉලක්ක කරගත් පහරදීම් සහ පවුලේ සාමාජිකයන් විසින් කරන ලද ප්‍රචණ්ඩත්වය වැඩි වශයෙන් යොමු වුනේ මුස්ලිම් කාන්තා අපේක්ෂකයන්ටය.

එසේම මේ කාර්තුවේදී අම්පාර සහ නුවර දිස්ත්‍රික්කවල මුස්ලිම් ප්‍රජාවට සිංහල-බෞද්ධ යැයි හඳුනා ගන්නා කණ්ඩායම්වලින් ක්‍රමානුකූල ප්‍රහාර එල්ලවිය

නුවර දී, ඇතැම් ජීවිත අහිමි වීම් සිදු වූ අතර, අම්පාරේ සිදු වූවාට වඩා පල්ලි, නිවෙස්, වෙළෙඳ ආයතන, වාහන ආදිය ඇතුළුව දේපලවලට හානි කිරීම් සිදු විය. ස්ථාන දෙකෙහි දීම, දිවි ගලවා ගත්තවුන්, ඇසින් දුටු සාක්ෂිකරුවන් විසින් චෝදනා කළේ පොලීසිය බලා සිටියදී, ප්‍රමාද වෙමින් සිටියදී, සෑහෙන තරම් ප්‍රතිචාර නොදක්වා සිටියදී මේ සිද්ධි සිදු වූ බවයි. සමහර අවස්ථාවන්හි, පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් භෞතිකව සහ වාචිකව මුස්ලිම් පුද්ගලයන් අපයෝජනයට ලක් කර ඇත.

අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ සාමාජිකයන් අවසානයේ පෙබරවාරි 28 වැනිද පත් කරනු ලැබිණි. නමුත් 2015 සැප්තැම්බර් මාසයේ පොරොන්දු වුනු සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධ ආයතන තුන – හානි පූරණය සඳහා කාර්යාලයක්, සත්‍ය පිළිබඳ කොමිසක් සහ විශේෂ අධිකරණක් - යන ඒවා අවිනිශ්චිත සහ අනියත ලෙස පවතී. අඩුම ගණනේ කෙටුම්පත් කළ නීතිවත් ඉදිරිපත් වී නැත. උතුරේ හමුදාවල භූමිකාව අඩු කිරීම, හමුදාව තබාගෙන සිටින ඉඩම් නිදහස් කිරීම, දේශපාලන සිරකරුවන් සඳහා යුක්තිය, යුද්ධයෙන් මිය ගිය අය සැමරීම සඳහා සමාන අවස්ථා ලබා දීම වැනි යුද්ධය සම්බන්ධ අනෙකුත් කාරණා ආමන්ත්‍රණය කිරීමට ගැනීමට ඇති වෙනත් පියවර වේදනාකාරී ලෙසින් අතිශයින් හෙමින් සිදු වෙනවා හෝ සිදුවන්නේම

නැති තරම්ය. නව ව්‍යවස්ථාවක් සඳහා ප්‍රගතිය ද එසේම ඇණහිට ඇත. ජනමාධ්‍යවේදීන් සහ සිවිල් වැසියන් පසුගිය රජය යටතේ මරා දැමීම හා අතුරුදහන් වීම් සම්බන්ධයෙන් වන හමුදාවට විරුද්ධ නඩු ද ඇදී ගෙන යන නමුත්, එතරම් ප්‍රගතියක් නැත.

හමුදාව විසින් අල්ලාගෙන සිටින ඉඩම් සම්බන්ධයෙන්, උතුරේ පූර්ව යුද කලාපවල අඛණ්ඩව සිදු වූ අතුරුදහන් වීම් සම්බන්ධයෙන් පිළිතුරු අපේක්ෂාවෙන් සිදු කරනු ලබන විරෝධතා දීර්ඝ කාලීන ලෙස අඛණ්ඩව සිදුවේ. ඔවුන් පෙබරවාරි-මාර්තු කාලයේ වසරක් සම්පූර්ණ කිරීමෙන් පසු සහ නිදහස් දිනය වන පෙබරවාරි 4 වැනිදා, පොලීසිය සහ හමුදා විසින් මර්දනකාරී ඇතැම් ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව විරෝධතාවයන් තවදුරටත් තීව්‍ර විය.

සිංහල බහුතරයක් සිටින ප්‍රදේශවල, කෝපයට පත් විරෝධතාකරුවන් පොලීසියට එරෙහිව ප්‍රචණ්ඩව හැසිරී ඇති අතර, කෙසේ වුවත් විරෝධතාකරුවන්ගේ නිරායුද ස්වභාවයත්, කුපිත වීමත් සමග පොලිසියේ ප්‍රතිචාර සැලකූ කල පෙනෙන්නේ විසමානුපාතික බවයි. එක් අවස්ථාවකදී, ගල් විසි කළ විරෝධතාකරුවන් අත්අඩංගුවට ගත්තා පමණක් නොව, රැඳවුම් භාරයේ සිටියදී පහර කෑමට ද ලක්ව ඇති බැව් වාර්තා විය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයකට විරුද්ධව උද්ඝෝෂණය කළ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට සහ දෙමාපියන්ට පහර දෙන ලදී. එසේම නවකවදයට විරුද්ධ වූ සිසුන් පිරිසකට, නවකවදය සිදුකළ සිසුන් පිරිසක් විසින් පහර දුන් බවද වාර්තා වේ.

ජනමාධ්‍යවේදීන්ට කළ තර්ජන, හිරිහැර සහ බාධාවන් ගැන සිදුවීම් කිහිපයක් රටේ විවිධ පැතිවලින් වාර්තා වූ අතර, හමුදාවට සහ දේශපාලනඥයකුගේ පාක්ෂිකයන්ට චෝදනා එල්ල විය. එච්අයිවී නිවාරණය සම්බන්ධ ව්‍යාපෘතියකට සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධානයක සේවකයන්ට කිසියම් කණ්ඩායමක් විසින් පහර දෙන ලද්දේ පොලිසිය සහ මාධ්‍ය බලා සිටියදීය. සාක්කි දීමට උසාවියට පැමිණි අවස්ථාවේදී නීතිඥවරියක් පහර කෑමට ලක් වූවාය. බදුල්ලේ ගුරුවරියක් පළාත් මහ ඇමති ඉදිරියේ දණ ගසනු ලැබීමට බල කරනු ලැබූ අතර, මේ සිද්ධිය ඇය එළිදරව් කිරීමෙන් පසු මරණ තර්ජනයන්ට පාත්‍ර වන්නට සිදු වූ බව ඇය පැමිණිලි කළාය. මේ අතර ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සේවා මණ්ඩල සමාජිකයෙක් විසින් ලන්ඩන් හි විරෝධතාකරුවන් වෙත තර්ජනාත්මක ඉඟියක් කරන ලදී.

සිද්ධි 22න් 9ක දීම, වින්දිතයෝ කාන්තාවන් වූහ. විරෝධතා වැනි සිද්ධි 7 කදී ගැහැණු පිරිමි දෙපාර්ශවයම වින්දිතයෝ වූහ. එසේම මෙම සිද්ධි 22 රටේ ඇති පළාත් 9න්, 8කට අයිති විය. සිද්ධි දෙකක් අගනුවර වන කොළඹින් වූ අතර, අනෙකුත් සිද්ධි මුලතිවු, යාපනය, මඩකලපුව, අනුරාධපුරය, පොලොන්නරුව, පුත්තලම, හම්බන්තොට, ගාල්ල, මොනරාගල, බදුල්ල හා නුවර දිස්ත්‍රික්කවලින් වාර්තාව විය. එක් සිද්ධියක් ලන්ඩන්වලින් වාර්තා වූ අතර, අවසාන සිද්ධිය ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත (VSSO) සඳහා යෝජිත නීතිමය සංශෝධනය විය. එයින් මුළු රටේම සංවිධානය වීමේ නිදහසට සෘණාත්මක බලපෑමක් ඇති වීමට ඉඩ තිබුනි.

## A කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

පළාත් පාලන ආයතනවල 2%කට වඩා අඩු ප්‍රමාණයක් කාන්තා නියෝජිතයන් සිටින අවස්ථාවක, 2018 පළාත්පාලන මැතිවරණයේ දී කාන්තා නියෝජනය සඳහා 25%ක අනිවාර්ය කොටසක් වෙන් වීම බොහෝ කාන්තා කණ්ඩායම්, ක්‍රියාකාරීන් සහ දේශපාලනඥයන් විසින් සාදරයෙන් භාර ගන්නා ලදී. නමුත් ඡන්දය සිදු වීමේ දී කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට එරෙහිව රට පුරා ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිද්ධි ගණනාවක් වාර්තා විය. වින්දිතයෝ ප්‍රධාන ජාතික දේශපාලන පක්ෂවල, කලාපීය පක්ෂවල මෙන්ම නිදහස් කණ්ඩායම්වල අපේක්ෂිකාවෝ ද වූහ. පෙබරවාරි 2 වැනිදා පළ වූ මාධ්‍ය වාර්තාවක් අනුව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) වෙත කාන්තා අපේක්ෂකයන් මුහුණ පෑ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පැමිණිලි 34ක් ලැබී ඇත. කෙසේ වුවත් ක්‍රියාකාරීන් පෙන්වා දුන්නේ පලි ගැනීමට ලක් වෙනු ඇතැයි යන බිය නිසා වාර්තා නොවූ සිද්ධි බොහෝ ගණනක් තිබිය හැකි බවයි. මේ වාර්තාව මෙන්ම කාන්තා ක්‍රියාකාරී ජාලය ද සඳහන් කරන්නේ කාන්තා අපේක්ෂකයන් වෙත යොමු වූ ප්‍රචණ්ඩත්වය සහ බිය ගැන්නවීම් විවිධ ආකාරයෙන් සිදු වූ බවත් ඒ අතරට සමාජ මාධ්‍ය යොදා ගෙන චරිත ඝාතනය, පෞද්ගලික නිවෙස්වලට හානි කිරීම, තර්ජනය කිරීම, සැමියාගෙන් වන පහර දීම් සහ වාචික හිංසනය, ආදිය අඩංගු විය. අමානුෂික ශාරීරික පහර දීමකට ලක් වූ එක් අපේක්ෂිකාවක් බරපතල තත්වයෙන් රෝහලට ඇතුලත් කළ අතර, තවත් අයෙකුට ශාරීරිකව පහර දී නිවසක හිර කර තබන ලදී. කාන්තා ක්‍රියාකාරීන් එලෙසම සඳහන් කළේ කාන්තාවන් දේශපාලනයට පැමිණීමට නොගැලපෙන බව, කාන්තා ඡන්ද අපේක්ෂකයන් "අනාචාරී ස්ත්‍රීන්" යැයි කටකතා පැතිරවීම, අයථා සම්බන්ධතා ගැන නිශ්චිත, විවෘත ප්‍රකාශ කිරීම කාන්තා අපේක්ෂකයන්ට ඍණාත්මක ලෙස බල පා ඇති බවයි. මුස්ලිම් කාන්තා ඡන්ද අපේක්ෂිකාවක් එසේම වාර්තා කළේ "ඡන්දවලට ඉදිරිපත් වෙන කාන්තාවො නියම මුස්ලිම් කාන්තාවො නෙමෙයි කියලා මවුලවිලා කියලා තියෙනවා. ගෑනු අයට වේදිකාවක නැගලා, ප්‍රසිද්ධියේ කතා කරන්න බැහැ කියලා ඒ අය කියලා තියෙනවා" යනුවෙනි.

පහත දැක්වෙන්නේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවන්ට එරෙහි සිදු වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් උදාහරණ කිහිපයකි.

### 1. මුලතිවු දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම

මංජුලා පද්මනාදන් ලංකා දෙමළ සංධානයේ (ITAK) අපේක්ෂිකාවකි. ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පාක්ෂිකයෙක් විසින් ඇගේ කටට වසමින් බැඳ, දෑස් වසා, පහරදුන් පුද්ගලයාගේ නිවසේ ජනේලයකට බැඳ, ඇයට පහරදුන් බව ඇය කීවාය. මේ ගැන ඇය පොලීසියට පැමිණිලි කර ඇති අතර, ඇයට සහ පවුලේ අයට ටයරයක දමා පණපිටින් ගිනි තබා මරන බවට තර්ජනය කිරීමෙන් පසු ඇය පැමිණිල්ල ඉල්ලා අස් කර ගෙන ඇත[1].

### 2. මොනරාගල දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම

මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ඡන්ද බල ප්‍රදේශයේ නිදහස් කණ්ඩායමක අපේක්ෂිකාවක අමානුෂික පහර දීමකට ලක්ව රෝහලට ඇතුළත් කර ඇත්තේ නිදහස් කණ්ඩාම්වල අපේක්ෂකයන් සහ දේශපාලන පක්ෂවල පාක්ෂිකයන් අතර ඇතිවූ ගැටුමකට පසුය[2].

---

[1] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=178551 (Accessed on 22nd of July 2018)

[2] http://www.sundaytimes.lk/180128/news/intimidation-insults-attempt-to-deter-women-poll-candidates-278866.html(Accessed 22nd of July 2018)

3. මඩකලපුව දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවකට පහර දීම

නිදහස් සහ සාධාරණ ඡන්ද සඳහා ව්‍යාපාරය (CaFFE) පවසන ආකාරයට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (SLFP) අලියාර් රහුමාන් නම් මුස්ලිම් ඡන්ද අපේක්ෂිකාවක් මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් හි, එක්සත් ජාතික පක්ෂ (UNP) අපේක්ෂකයකුගේ පහර කෑමට ලක්ව ඇත්තේ, ඇය ප්‍රදේශයේ ඡන්ද ප්‍රචාරණයේ යෙදී සිටියදී ය. කැෆේ (CaFFE) ව්‍යාපාරයේ විධායක අධ්‍යක්ෂක රංජිත් කීර්ති තෙන්නකෝන් ප්‍රකාශ කළේ ඡන්ද ව්‍යාපාරවල පටන් ගැන්නේ සිටම මඩකලපුවේ කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට කරදරවලට මුහුණ පෑමට සිදු වූ බවයි[3].

4. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කාන්තා ඡන්ද අපේක්ෂිකාවක ලිංගික අපයෝජනය කිරීම

පෙබරවාරි 2 වැනි ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා අපේක්ෂිකාවක්, වැලිකන්ද එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයාගේ රියදුරා විසින් ලිංගික අපයෝජනයකට ලක් කළ බවට වාර්තා වන බව කැෆේ ව්‍යාපාරය සඳහන් කරයි. ඡන්ද ව්‍යාපාරයට සම්බන්ධ රැස්වීමකට සහභාගි වීමෙන් අනතුරුව ආපසු යමින් සිටිය දී, සැකකරු විසින් ඇයව ඡායාරූප ගත කර ඇති අතර, අනතුරුව ඇගේ පියයුරු මිරිකා ඇත. මේ සම්බන්ධයෙන් ඇය විසින් පොලිස් පැමිණිල්ලක් කර ඇත. සැකකරු ප්‍රදේශයෙන් පලා ගොස් ඇති බව වාර්තා වේ[4].

5. ස්ත්‍රී ඡන්දදායකයාගේ ගෙදර ආක්‍රමණය කරයි

ජනවාරි 4 වැනිද, කරුණා අම්මාන්ගේ දෙමළ ජනතා විමුක්ති කොටි (TPLT) පක්ෂයේ අපේක්ෂිකාවකගේ මඩකලපුව, සෙල්වා නගර්හි පිහිටි නිවස කඩා කිසිවකු ඇතුළු වී ඇත[5].

6. මුස්ලිම් කාන්තා ඡන්ද අපේක්ෂකයන්ට විරුද්ධව මවුලවිගේ වීඩියෝ ප්‍රකාශය




(රූපය- මවුලවි නියාස් සිද්දීක් සිරාජ්, ඡායාරූපය-www.pinterest.com)

[3] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=179412 (Accessed on 22nd of July 2018)

[4] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=179412 (Accessed on 22nd of July 2018)

[5] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=178551(Accessed on 22nd of July 2018)

තිහාරියේ නියාස් සිද්දීක් සිරාජ් මවුලවි විසින් වීඩියෝ පණිවුඩයක් නිකුත් කරමින් කියා සිට ඇත්තේ "අද, හිස ආවරණය කරන් ඉන්න මුස්ලිම් කාන්තාවන් ඡන්දවලට ඉදිරිපත් වෙලා තමන්ගෙ මූණු අනෙක් පිරිමින්ට පෝස්ටර්වලින් පෙන්වනවා. ගෑනුන්ට දේශපාලනයට පැමිණෙන්න ඉස්ලාමීය ධර්මය අනුව කිසි ඉඩක් නැහැ. මේ ගෑනු අපේ ප්‍රජාවටත්, ඒ අයගේ සැමියන්ටත් ලැජ්ජාව ගෙන දෙනවා. ඒ අය ඉස්ලාම් දහමට අපහාස කරන පව්කාරයෝ. මේ අයගේ පෝස්ටර් තාප්පවල සහ වට්ස්ඇප්වල දැකීම – හරිම හිරිකිතයි! සැමියනි, උඹලා කරන්නේ මොනවාද? මුළු ලෝකයම ඔවුන්ගේ පෝස්ටර් දිහා බලනවා. ඡී! උඹලාට ලැජ්ජාවක් නැද්ද? ඉස්ලාමයේ හැටියට ගෑනුන් විසින් පාලනය කරන සමාජයක් කිසිසේත්ම සාර්ථක වෙන්නේ නැහැ." මේ වීඩියෝවේ ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් කාන්තා ඡන්ද අපේක්ෂකයන් ගණනාවක් ඔවුන්ගේ ඡන්ද ව්‍යාපාරවලින් ඉවත් වූහ[6].

## 7. කාන්තා අපේක්ෂිකාවගේ නිවෙස පොලීසියෙන් වට කරයි

ජනවාරි 15 වැනිද ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ අපේක්ෂිකාවක් වූ රිනූසා ඉල්මාගේ නිවෙස නොරොච්චෝලේ පොලීසියට අනුබද්ධ පොලිස් නිලධාරීන් විසින් හදිසියේ වටලන ලදී. පොලීසිය කීවේ 119 පොලිස් හදිසි ඇමතුම් අංකය වෙත රිනූසා ළඟ ආයුද තිබෙන බවට පැමිණිලි කරමින් දුරකතන ඇමතුමක් ලැබුනු බවයි. පොලීසිය විසින් මෙම වැටලීම සිදු කළේ කාන්තා පොලිස් නිලධාරියෙක් නොමැතිව වන අතර, මෙය ඔවුන්ගේ ව්‍යවස්ථාවලට විරුද්ධ වේ. පොලිස් නිලධාරීන් විසින් කිසිදු සැක සහිත දෙයක් සොයා ගත්තේ නැත. මේ සිද්ධියෙන් පසු, වින්දිතයා විසින් තවත් කාන්තා ඡන්ද අපේක්ෂිකාවක් සමග පොලීසියට ගොස් මේ ගැන පැමිණිල්ලක් කිරීමට උත්සාහ කළත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ ඔවුන් විසින් කීවේ පැමිණිලි බාර ගන්නා නිලධාරියා සේවයට පැමිණ නැති බවයි. මේ තත්වයේ දී, වින්දිතයා විසින් ඡන්ද කොමිසම මේ ගැන දැනුවත් කර ඇති අතර, සිද්ධිය ප්‍රසිද්ධියට පත් වූයේ එයින් පසුවය. ඡන්ද කොමිසමේ මැදිහත් වීම නිසා පැමිණිල්ල භාර ගැනුනි[7].

---

[6] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=178551 (Accessed on 22nd of July 2018)

[7] http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=178551 (Accessed on 22nd of July 2018)

## B උතුරේ දෙමළ ක්‍රියාකාරීන්ට බාධා සහ තර්ජන

2009 වසරේ යුද්ධයේ අවසානයට පසුව සහ 2015 ආණ්ඩු වෙනසට පසුව, යුද්ධයේ බලපෑමට ලක් වූ උතුරු පළාතේ දෙමළ ජනතාව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, ඉඩම් ගැටළු වැනි විවිධ කාරණා සම්බන්ධයෙන් උද්ඝෝෂණය කරමින් සිටිති. මේ උද්ඝෝෂණවලට බොහෝ විට නායකත්වය දුන්නේ වින්දිත පවුල්වල සහ බලපෑමට ලක්වූ ප්‍රජාවන්හි කාන්තාවන් වන අතර ඒවා බොහෝ විට සාමකාමී ඒවා විය. නමුත් විරෝධතාකරුවන් සහ ඒවාට සහයෝගය දෙන්නන් නිරන්තර අවේක්ෂණයට, බිය ගැන්නවීමට, තර්ජන, පහරදීම් සහ අත්අඩංගුවට ලක් වීම ආදියට ලක් විය. මේ කාර්තුවේ වාර්තා වූ ඇතැම් සිද්ධි පහතින් දක්වේ.

### 8. කයිට්ස්වල ඉඩම් ගැන විරෝධතාවේ නියැලුනු දමිළ ජාතිකයන්ට නාවික හමුද බුද්ධි අංශ තර්ජනය කරයි




*(රූපය- කයිට්ස් හි විරෝධතාකරුවෝ - ටැමිල් ගාඩියන්)*

ජනවාරි 25 වැනිද, කයිට්ස්වල විරෝධතාවයක නියැලුනු දෙමළ සිවිල් වැසියන් ට ශ්‍රී ලංකා නාවික හමුද නිලධාරීන් විසින් තර්ජනය කරන ලදී. විරෝධතාකරුවන් කීවේ තමන් පදිංචිව සිටින්නේ නාවික කඳවුරෙන් වටවුණු අක්කර 3ක කුඩා ඉඩමක බවයි. විරෝධතාකරුවන්ට අයිති පෞද්ගලික ඉඩම්වල මෙම නාවික හමුද කඳවුර ගොඩ නගා, වසර 10ක් තිස්සේ පවත්වා ගෙන යන බැවින්, ඔවුන් විරෝධතාවක් කර ඉල්ලා සිටියේ තමන්ගේ ඉඩම් නිදහස් කරන ලෙසයි. එය සාමකාමී විරෝධතාවක් වූ අතර, නාවික හමුද බුද්ධි අංශ නිලධාරීන් නිල ඇඳුම් රහිතව පැමිණ තමන්ට තර්ජනය කරන ලද බව විරෝධතාකරුවන් විසින් කියා සිටින ලදී.[8]

[8] http://www.tamilguardian.com/content/navy-intelligence-officers-threaten-tamils-protesting-against-land-grabs-kayts (Accessed on 22nd of July 2018)

## 9. කේපාපුලාවු හි ඉඩම් අල්ලා ගෙන සිටීමට විරුද්ධව දෙමළ ජනතාව කළ විරෝධයට විරුද්ධව පොලිස් ක්‍රියාමාර්ග



(රූපය- කේප්පාපුලාවු විරෝධතාවයට පොලිසිය බාධා කරන අයුරු, ඡායාරූපය - ටැමිල් ගාඩියන්)

මුලතිවු දිස්ත්‍රික්කයේ කේපාපුලාවු ගම්වැසියෝ 2017 මාර්තු මාසයේ සිට විරෝධතාවයේ නියැලෙන්නේ හමුදාව විසින් අල්ලාගෙන සිටින තමන්ගේ ඉඩම් නිදහස් කරන ලෙස ඉල්ලමිනි. ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් දින සැමරුම පැවැත්වූ පෙබරවාරි 4 වැනිද, ඔවුන් 339 වැනි දිනටත් විරෝධතාවය පවත්වා ගෙන ගිය අතර, කලු කොඩි එසවූ විරෝධතාකරුවන් තමන්ට නිදහසේ ජීවත් වීමට නිදහස නොමැති බවත් කියමින්, නිදහස් දිනයේ අරුත ප්‍රශ්න කළෝය. සාමකාමී විරෝධතා පෙළපාලියක යෙදෙමින් තමන්ගේ විරෝධතාවය ගමේ පිහිටා තිබූ යුද හමුද කඳවුර ඉදිරියේ පැවැත්වීමට ඔවුහු උත්සාහ කළෝය. නමුත් පොලීසියෙන් පැමිණ ඔවුන්ට නියෝග කළේ විරෝධතාවය නතර කරන ලෙසත්, කලු කොඩි භාවිත කිරීම නතර කරන ලෙසත්ය. පසුව පොලිසිය විසින් මුලතිවු මහේස්ත්‍රාත් අධිකරණයේ විරෝධතාවයට සම්බන්ධ වූ දමිළ පුද්ගලයන් 5 දෙනෙකුට විරුද්ධව නඩු පැවරූ අතර, ඔවුන්ට උසාවියේ පෙනී සිටින ලෙස නියෝග කර ඇත[9] [10].

## 10. විරෝධතාවට සහභාගි වීමෙන් පසු උතුරු පළාත් සභා මන්ත්‍රී අත්අඩංගුවට



(රූපය- පළාත් සභා මන්ත්‍රීවරයා උසාවියට රැගෙන යන අයුරු, ඡායාරූපය -ටැමිල් ගාඩියන්)

උතුරු පළාත් සභා මන්ත්‍රී තුරෙයිරාසා රවිකරන්, පෙබරවාරි 28 වැනි දින පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන මුලතිවු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. රවිකරන් මහතාට සිදු කළ චෝදනා වූයේ පෙබරවාරි 22 වැනි ද, මුලතිවු හි වඩ්ඩවකාල් හි පැවැති විරෝධතාවයක් අතරතුර රජයේ නිලධාරීන්ට බාධා කිරීම සහ මහජන දේපලට හානි කිරීමයි. ඔහු චෝදනා ප්‍රතික්ෂේප කරන අතර, පසුව ඇප පිට නිදහස් කරන ලදී. විරෝධතාකරුවන්ට අනුව අක්කර 600ක පෞද්ගලික ඉඩම් අත්පත් කර ගෙන නාවික හමුද කඳවුරක් තැනීමට යන අතර, මෙය දැනටමත් රජයේ ගැසට් පත්‍රයක පළ කර ඇත. මිනින්දෝරුවන් ඇතුළු රජයේ නිලධාරීන් අදළ

---

9 http://www.tamilguardian.com/content/sri-lankan-police-file-case-against-keppapulavu-protesters-independence-day-black-flag(Accessed on 22nd of July 2018)

10 https://www.tamilguardian.com/content/police-attempt-stop-keppapulavu-families-holding-black-flag-protest (Accessed on 22nd of July 2018)

ස්ථානයට පැමිණි විට පළාත් සභා මන්ත්‍රීවරයා ඇතුළු විරෝධතාකරුවන්ගේ විරෝධය මධ්‍යයේ ආපසු හැරී යාමට සිදු වී ඇත[11].

## C ශිෂ්‍ය ක්‍රියාකාරීන් මර්දනය

පසුගිය අවුරුදු කිහිපය තිස්සේ, ශිෂ්‍ය ක්‍රියාකාරීන් පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම, පහර දීම, සහ බාධා කිරීම ආදිය සිදු වී ඇත. මේ කාර්තුව තුළ අඩුම ගණනේ එවැනි සිද්ධි 1ක් වාර්තා විය. එසේම ලංකාවේ විශ්ව විද්‍යාලවල නවක වදය ලබා දීම වසර ගණනාවක් තිස්සේ පවතින ගැටළුවක් වෙන අතර, මේ කාර්තුවේ දී, නවක වදයට විරුද්ධව නැගී සිටි ශිෂ්‍ය ක්‍රියාකාරීන් කිහිප දෙනෙකුට, අනෙකුත් ශිෂ්‍යයන් පහර දුන් බවට ද වාර්තා විය.

11. **නවකවද විරෝධී ශිෂ්‍යයන්ට පහරදීම**




*(රූපය- පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ඡායාරූපය - newsfirst.lk)*

ජනවාරි 14 වැනිදා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දී, එහි ශිෂ්‍යයයන් දෙදෙනෙකුට වෙනත් ශිෂ්‍යයන් කණ්ඩායමක් විසින් පහර දෙන ලදී. වින්දිතයන්ට අනුව, ඔවුන්ට පහර දී ඇත්තේ කළමණාකාර පීඨයේ ශිෂ්‍යයන් වෙන අතර, මීට හේතුව වී ඇත්තේ ඔවුන් නවක සිසුන්ට නවක වදය ලබා දීමට විරුද්ධ වීමයි. තුන් වැනි වසරේ විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් වන වින්දිතයන් රෝහල් ගත කර ඇත. විශ්ව විද්‍යාල අධිකාරීන් කියන්නේ මේ ගැන පරීක්ෂණ කෙරෙමින් පවතින බවයි[12].

---

[11] http://www.tamilguardian.com/content/sri-lankan-police-arrest-npc-councillor-over-land-grabs-protest (Accessed on 22nd of July 2018)

[12] http://island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=178255 (Accessed on 22nd of July 2018)

## 12. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ සහ දෙමාපියන්ගේ විරෝධතාවය විසුරුවා හැරේ



*(රූපය- පොලිසිය විරෝධතාකරුවන් වෙත කඳුළු ගෑස් එල්ල කරයි, ඡායාරූපය - නිසල් බඳුගේ - ඩේලිමිරර්)*

ජනවාරි 25 වැනි ද, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සහ වෛද්‍ය ශිෂ්‍යයන්ගේ දෙමාපිය එකමුතුව සංවිධානය කළ විරෝධතාවක් කොල්ලුපිටිය හන්දියේ දී පොලීසිය විසින් විසුරුවා හරින ලදී. විරෝධතාව පැවැත්වුනේ දකුණු ආසියානු තාක්ෂණ සහ වෛද්‍ය ආයතනය (සයිටම්) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) බවට හැරවීමට රජය විසින් ගෙන තිබූ තීරණයට එරෙහිවය. විරෝධතාකරුවන් අගමැති නිලනිවස සහ කාර්යාලය පිහිටා ඇති අරලිය ගහ මන්දිරය දෙසට යෑමට උත්සාහ කිරීමේ දී පොලිසිය බාධක යොදා කොල්ලුපිටිය හන්දියේ දී ඔවුන් අවහිර කරන ලදී. පසුව පොලිසිය විසින් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගනිමින් විරෝධතාකරුවන් විසුරුවා හරින ලදී[13].

[13] http://www.dailymirror.lk/article/Anti-SAITM-protest-teargassed-144624.html (Accessed on 22nd of July 2018)

## D ජනමාධ්‍යවේදීන්ට එරෙහි තර්ජන සහ බාධා

පසුගිය අවුරුදුවල මෙන් නොව, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට සාපේක්ෂ වශයෙන් තර්ජන අඩු වටපිටාවක් ලෙස 2015න් පසු කාලය දකිනු ලැබේ. මේ තත්වය පසුගිය අවුරුදු කිහිපයේම පැවතියත්, මේ කාර්තුවේ, ජනමාධ්‍යවේදීන් – සිංහල, දෙමළ සහ විදේශීය ජනමාධ්‍යවේදීන් – තර්ජන, හිරිහැර සහ බාධා කිරීම් ආදියට, යුද හමුදව, නාවික හමුදව සහ දේශපාලන පාක්ෂිකයන් විසින් ලක් කරන ලදී. පහත දක්වෙන්නේ වාර්තා වූ එවැනි සිද්ධි 3කි.

### 13. රූපවාහිනී ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුට තර්ජන




*(රූපය- තමන් තර්ජනය කිරීමට ලක්වූ බව ප්‍රකාශ කළ ජනමාධ්‍යවේදීන් - ඡායාරූපය -බීබීසී)*

2018 ජනවාරි 28 වැනිදා, කපිල කුරුප්පුආරච්චි සහ ජයලත් දිසානායක නම් සිරස සහ දෙරණ පෞද්ගලික මාධ්‍ය නාලිකාවල ජනමාධ්‍යවේදීන් දෙදෙනා හට තර්ජනය කරනු ලැබ ඇත. ප්‍රවාහන ඇමැති නිමල් සිරිපාලද සිල්වා ගේ මහජන සම්බන්ධතා නිලධාරී අජිත් හික්කඩුව ලියනගේ විසින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාද සහභාගි වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බදුල්ලේ පැවැති රැළියක දී මෙසේ තර්ජනය කර ඇත. “නිලධාරියා අපිට තර්ජන කළේ බදුල්ල දෙමළ කාන්තා විද්‍යාලයේ විදුහල්පතිනියට ඌව ප්‍රධාන ඇමති චාමර දසනායක විසින් පහර දීම ගැන අපි කළ වාර්තා කිරීම සම්බන්ධයෙන්” යැයි ජනමාධ්‍යවේදීන් දෙදෙනා බදුල්ල පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. පොලිස් පැමිණිලි අංකය CIB 3 319/285 වේ[14].

[14] https://www.bbc.com/sinhala/sri-lanka-42851553 (Accessed on 22nd of July 2018)

14. අල් ජසීරා මාධ්‍යවේදී කණ්ඩායම හමුදාව විසින් අවහිර කරයි


Ruki Fernando
@rukitweets

Heavily armed Army & Navy try stop #AlJazeera crew wid Govt media accreditation cards from roadside filming. Buwelikada junction, #Kandy #lka. 12noon. Says they been "ordered" not allow filming. One warned they dont like situation being known overseas @MangalaLK @Sudarshana_RN

12:03 AM - 13 Mar 2018

*රූපය - රුකී ප්‍රනාන්දු මේ ගැන සිදු කළ ට්විටර් පණිවුඩය*

අල්ජසීරා රූපවාහිනියේ ජනමාධ්‍ය කණ්ඩායම 2018 මාර්තු 12 වැනි දින, දහවල් 12ට පමණ, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ යුද හමුදාව විසින් මහනුවර දී අවහිර කිරීමට ලක් කර ඇත. බුවෙලිකඩ හන්දියේදී මෙම ජනමාධ්‍යවේදීන් කණ්ඩායම යුද හමුදාව සහ නාවික හමුදාව විසින් වට කර ඔවුනට බාධා කර ඇත. හමුදා සාමාජිකයන් කීවේ මෙවැනි සිද්ධි රටින් පිට වාර්තා කිරීම අවශ්‍ය නොවන බවත්, ඔවුන් ඉහළ නිලධාරීන් විසින් එවැනි සිද්ධි වළක්වන ලෙස අණ ලබා දී ඇති බවත් ය. මේ සිද්ධිය ගැන රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජෙනරාල් වෙත ඉන්ෆෝම් කාර්ය මණ්ඩලය විසින් දැනුම් දීමෙන් පසුව, එවැනි සීමා කිරීමක් නොපවතින බවට ඔහු තහවුරු කළ අතර, ජනමාධ්‍යවේදීන් කණ්ඩායමට නිදහසේ වීඩියෝ කිරීමේ කටයුතු කර ගෙන යාමට අවසර දෙන ලදී.

15. දෙමළ ජනමාධ්‍යවේදියාට යුද හමුදා නිලධාරීන් හිරිහැර කරයි






*(රූපය- විනාශ කළ සොහොන් බිම (වමේ) සහ ශන්මුගම් තවසීලන් (දකුණේ) ඡායාරූප- ටැමිල් ගාඩියන්/ ජේඩීඑස්)*

දෙමළ ජනමාධ්‍යවේදී ශන්මුගම් තවසීලන් හට මාර්තු 19 වැනිද හමුද සොල්දදුවන් විසින් මුලතිවු දිස්ත්‍රික්කයේ අලම්පිල් හිදී හිරිහැර කර ඇත. ජනමාධ්‍යවේදියා කොළඹ පිහිටි ආසියානු මාධ්‍ය ජාලයේ සේවය කර ඇත.

අලම්පිල් හි පදිංචිකරුවෝ හමුදව විසින් 2009 වර්ෂයේ සිට අල්ලා ගෙන සිටින ඔවුන්ගේ සොහොන් පිටිය රජය විසින් ස්ථිරව පවරා ගැනීමට යන බව අසා කෝපයට පත්ව සිටියහ. මේ සොහොන් පිටියේ මියගිය දෙමළ කොටි සටන්කරුවන් වල දමා තිබූ අතර, හමුදව විසින් සොහොන් කොත් විනාශ කර, ඥතීන්ට ඇතුළු වීම තහනම් කර තිබුනි. එසේම එම ඉඩම හමුදව විසින් කෘෂි-ව්‍යාපාර සහ ආපන ශාලාවක් ඇතුළු වෙනත් ව්‍යාපාර සඳහා ද යොද ගෙන තිබුනි.

ජනමාධ්‍යවේදියා මේ ගැටළුව ගැන වාර්තා කිරීම සඳහා ප්‍රදේශය වීඩියෝ කර ඇති අතර, යුද හමුද නිලධාරීන් විසින් ඔහු වළකා, ඔහුට හිරිහැර කර ඇත. ඔහුව ජ්‍යෙෂ්ඨ හමුද නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, ඔහුගේ වීඩියෝ කෙළේ මොනවාදයි බැලීමට ඉල්ලා සිට ඇත. ජනමාධ්‍යවේදියා විසින් එය ප්‍රතික්ෂේප කර ඇති අතර, තමන්ට මේ කාරණය ගැන වාර්තා කිරීමට ඇති අයිතිය වෙනුවෙන් පෙනී සිට ඇත.

සිද්ධිය යුද හමුද මාධ්‍ය ප්‍රකාශක ගේ අවධානයට යොමු විනි. එහි ප්‍රතිඵලයක් ලෙස, එය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් විමර්ශනය කිරීමෙන් පසු, හමුදව විසින් පසුව ජනමාධ්‍යවේදියාගෙන් සමාව ගත් බවට වාර්තා වේ[15].

15 http://www.jdslanka.org/index.php/news-features/media/766-sri-lanka-military-harass-tamil-journalist-for-filming-in-occupied-cemetery (Accessed on 22nd of July 2018)

## E විරෝධතා මර්දනය

වසර පුරාම ගැටළු රාශියක් සම්බන්ධයෙන් විරෝධතා පැවැත්වුනි. එයින් විරෝධතා දෙකක දී, කෝපයට පත් විරෝධතා කරුවන් විසින් ගල් විසි කර ඇත. සිද්ධි දෙකෙහිදී පොලිසිය විසින් විරෝධතාකරුවන් අත්අඩංගුවට ගෙන ඇති අතර, එක් සිද්ධියක දී තමන්ට පොලිස් අත්අඩංගුවේ දී පහර දුන් බව විරෝධතාකරුවන් පැමිණිලි කරන ලදී.

### 16. අත් අඩංගුවේ සිටියදී පොලිසිය විරෝධකරුවන්ට පහර දුන්නා



*(රූපය- වෙඩි තැබීම සිදුවූ ස්ථානය පොලිසිය පරීක්ෂා කරමින්, ඡායාරූපය – අද දෙරණ)*

කාන්තාවන් 13 දෙනෙක් ඇතුළුව විරෝධතාකරුවන් 58 දෙනෙක් ජනවාරි 21 වැනිදින ශ්‍රී ලංකාවේ දකුණේ පිහිටි කතරගමදී, පොලීසිය වෙත පහර එල්ල කිරීම, මහජන සාමයට බාධා කිරීම, ප්‍රධාන මාර්ගය අවහිර කිරීම සහ දේපලවලට හානි කිරීම යන චෝදනා යටතේ අත්අඩංගුවට ගන්නා ලදී. විරෝධතාවයට හේතුව වූයේ කතරගම ප්‍රාදේශීය සභාවේ සේවකයකු පොලිසිය විසින් ඝාතනය කිරීමයි. පොලිසිය ප්‍රකාශ කළ ආකාරයට වින්දිතයා ඔහුගේ යහළුවකු සමග යතුරු පැදියක නැගී ගමන් කරමින් සිටියදී, ප්‍රදේශය පරීක්ෂාවේ යමින් සිටි පොලිසිය ඔවුන්ට නතර කරන ලෙස අණ කළත්, ඔවුන් එය නතර කර නැති හෙයින්, පොලිසිය විසින් වෙඩි තබා ඇති බවයි. නමුත් යතුරුපැදිය පදවාගෙන ගිය පුද්ගලයා කීවේ තමන් යතුරුපැදිය නතර කර එයින් බැස්ස නමුත්, පොලිසිය වින්දිතයාට වෙඩි තැබූ බවයි.

කෝපයට පත් විරෝධතාකරුවන් පොලීසියට ගල්වලින් ගසා ඇත. පොලිසිය විසින් කඳුළු ගෑස්, බැටන් ප්‍රහාර සහ රබර් උණ්ඩ යොදා ගනිමින් විරෝධතාකරුවන් මර්දනය කිරීමට උත්සාහ කළ විට තත්වය තවත් තීව්‍ර විය. අවසානයේ විරෝධතාකරුවන් පොලිස් අත්අඩංගුවට ගන්නා ලදි. අත්අඩංගුවට ගත් විරෝධතාකරුවන්ගෙන් ඇතැමෙක් ප්‍රකාශ කළේ තමන් අත්අඩංගුවේ සිටියදී තමන්ට ශාරීරිකව පහර දුන් බවයි. අත්අඩංගුවට ගත් විරෝධතාකරුවන් 7 දෙනෙක් පසුව රෝහල් ගත කරන ලදී[16] [17] [18].

---

[16] http://www.adaderana.lk/news/45540/kataragama-shooting-incident-58-protesters-arrested(Accessed on 22nd[th] of July 2018)

[17] http://www.ft.lk/news/Chaos-in-Kataragama-after-fatal-Police-shooting/56-647764 (Accessed on 22[nd] of July 2018)

[18] https://www.youtube.com/watch?v=oLKGD0ztAX0(Accessed on 22nd of July 2018)

17. විරෝධතාවයේ නියැලි ගොවීන් අත්අඩංගුවට



*(රූපය- විරෝධතාකරුවන් පාර අවහිර කරන ලදී, ඡායාරූපය-නිව්ස්ෆස්ට්)*

අනුරාධපුර තඹුත්තේගම විරෝධතා දක්වමින් සිටි ගොවීන් විසුරුවා හැර, ඔවුන් 59 දෙනෙක් පෙබරවාරි 28 වැනි දින පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. විරෝධතාකරුවන්ට අනුව වසර ගණනාවක් තිස්සේ ඔවුන් රාජංගනය ජලාශය වී වගාව සඳහා යොද ගෙන ඇති අතර, දැන් පිරිසිදු ජල ව්‍යාපෘතියක් සඳහා එම ජලාශයම යොද ගැනීමේ සැලසුමක් ඇති අතර, මෙයින් ඔවුන්ගේ ජීවිතවලට තදබල බලපෑමක් වෙනු ඇත. ඒ අනුව තඹුත්තේගම නගරයේ එක් රැස්වූ දහස් ගණන් ගොවියෝ විරෝධතාවයක් ආරම්භ කළහ. පොලිසිය ඔවුන් විසිරුවා දැමීමට උත්සාහ කළ අවස්ථාවේ, ඔවුන් මාර්ගය අවහිර කරමින්, පොලිසිය වෙත ගල් විසි කර ඇත. පොලිසිය මෙයට ප්‍රතිචාර දක්වා ඇත්තේ කඳුළු ගෑස් සහ ජල ප්‍රහාරවලිනි. අවසානයේ, විරෝධතාවය විසුරුවා හැරි අතර, පොලිසිය විසින් ගොවීන් 59ක් අත්අඩංගුවට ගන්නා ලදී. මෙයින් සමහර දෙනෙක් ඇප පිට නිදහස් කරන ලදී. පොලිසියට අනුව පොලිස් නිලධාරීන් 7 දෙනෙකුට තුවාල සිදු වී ඇත.

සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න මෙසේ කීවේය, “අපි පිරිසිදු ජල ව්‍යාපෘතියට විරුද්ධ නැහැ. අපි ඒකට සම්පූර්ණයෙන්ම සහයෝගය දෙනවා, නමුත් අපි මේ ගැන විරෝධතාවය දක්වන්නේ රාජාංගනය වැවෙන් ප්‍රදේශයේ ගොවි පවුල් 35,000කට වතුර ලබා දෙනවා. රජයෙන් මේ තරම් අධික ප්‍රමාණයක් ව්‍යාපෘතියට ගත්තම, ගොවීන්ට වගා කරන්න වතුර නැහැ. වී ගොවිතැන තමයි මේ පවුල්වල ප්‍රධාන ජීවිකාව”. කරුණාරත්න තවදුරටත් කීවේ ප්‍රධාන ප්‍රශ්නය පැන නගින්නේ රජයේ වැරදි ජල ප්‍රතිපත්තියෙන් සහ ජල ප්‍රමුඛතා නිසා බවයි. ව්‍යාපෘතිය දැනට තාවකාලිකව නතර කර ඇත[19] [20].

[19] http://www.ft.lk/news/59-arrests-following-Thambuththegama-riots/56-650395 (Accessed on 23rd of July 2018)

[20] https://www.newsfirst.lk/2018/02/tension-thambuttegama-protesting-farmers-dispersed-police/(Accessed on 23rd of July 2018)

## F. අනෙකුත් ආකාරයේ තර්ජන සහ බිය ගැන්වීම්

උසාවියේ සාක්ෂි දීමට පැමිණි අවස්ථාවේ පහර කෑමට ලක්වූ නීතිඥවරියක් සම්බන්ධ වාර්තාවක් ද, ලන්ඩනයේ ශ්‍රී ලංකා මහලේකම් කාර්යාලයේ නිලධාරියෙක් (විශ්‍රාමික යුද හමුදා නිලධාරියෙක්) විසින් මහ ලේකම් කාර්යාලය ඉදිරිපිට විරෝධතාවයේ නියැලි දෙමළ විරෝධතාකරුවන් කණ්ඩායමකට තර්ජනාත්මක ලෙස ගෙල කපා දමන ආකාරය පෙන්වන ඉඟියක් සිදු කිරීම යන සිද්ධීන් දෙක මේ කොටසේ දී ඉදිරිපත් කෙරේ. මේ කොටසේ එසේම ඉදිරිපත් වන්නේ එච්අයිවී/ ඒඩ්ස් නිවාරණ වැඩසටහනකට සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධානයක් වෙත එල්ල වූ හිරිහැරය. අවසාන වශයෙන් දේශපාලනඥයකු විසින් තමන්ට සිදු කළ අවමන් සහගත ලෙස සැලකීමක් ගැන හෙළිදරව් කළ, පැමිණිලි කළ පාසැල් ගුරුවරියකට මුහුණ දෙන්නට වූ මරණ තර්ජන සම්බන්ධයෙන් ද මේ කොටසේ සාකච්ඡා වේ.

18. **ලන්ඩනයේ ශ්‍රී ලංකා මහලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ තර්ජනාත්මක ඉඟිය**



*(රූපය- බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු ක්‍රියාවේ යෙදෙමින්, ඡායාරූපය- ඩේලිමිරර්)*

බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු ආරක්ෂක විශේෂ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරි ලෙස එක්සත් රාජධානියේ ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහලේකම් කාර්යාලයේ සේවය කරද්දී, පෙබරවාරි 4 වැනි දින මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිට සාමකාමී විරෝධතාවයක නියැලුනු දෙමළ විරෝධතාකරුවන්ට තර්ජනය කිරීමේ චෝදන එල්ල විය. ඡායාරූපවල සහ වීඩියෝවල දැක්වෙන පරිදි, බ්‍රිගේඩියර්වරයා විසින් ගෙල සිඳලන ආකාරයේ ඉඟියක් විරෝධතාකරුවන් වෙත කර ඇත. මෙම බ්‍රිගේඩියර්වරයාගේ වැඩ තහනම් කළ බවට පළමුව විදේශ කටයුතු අමාත්‍යංශයෙන් වාර්තා වුවත්, පසුව ජනපතිගේ උපදෙස් මත ධූරයේ නැවත පිහිටුවා ඇත.

මේ අතර, එක් ජනපදයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනි ජොආන් රයන් කියන්නේ ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිගේඩියර් ප්‍රනාන්දු ගේ වැඩ තහනම ඉවත් කිරීම සම්බන්ධයෙන් තමන් තදබල නොසතුටට පත්ව ඇති බවයි. "මම දැනටමත් ආසියාව, පැසිෆික් කලාපය ගැන අමාත්‍ය මාක් ෆීල්ඩ් සමග මේ වැදගත් කාරණාව ගැන කතා කළා," යැයි ජොආන් රයන් ඇගේ ට්විටර් පණිවුඩයේ සඳහන් කර ඇත.

පසුව, ඔහුට ලංකාවට පැමිණෙන ලෙස නියෝග කරන ලද අතර, මේ කාරණය ගැන කිසියම් විමර්ශනයක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නැත[21] [22].

## **19.** මහේස්ත්‍රාත් උසාවිය තුළ නීතිඥවරියකට ප්‍රහාර




(රූපය-කොළඹ මහේස්ත්‍රාත් උසාවිය, ඡායාරූපය- නිව්ස්ෆස්ට්)

අපරාධ නඩුවක සාක්ෂි ලබා දීමට පැමිණි නීතිඥවරියකට කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඇතුළත දී පහර දී ඇත. වින්දිතයා වන නීතිඥ හෆ්සා අලීෆ් වෙත මෙසේ ශාරීරිකව පහර දී ඇත්තේ ඇගේ පෙර-සැමියා වන වෛද්‍ය ශස්ලි මව්ජූත් විසින් වෙන අතර, ඇය තවදුරටත් උසාවියේ සාක්ෂි දීමට උත්සාහ කරන්නේ මෙසේ පහර දෙන බවට ද තර්ජනය කර ඇත. වින්දිතයා විසින් මේ ගැන මහේස්ත්‍රාත් උසාවියේ පොලිස් මුරපොල වෙත පැමිණිලි කර ඇති අතර, ඇයව අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂා කර සිදු වූ තුවාල ගැන ද වාර්තා කර ගෙන ඇත. කෙසේ වුවත් පොලිසිය විසින් පහර දුන් තැනැත්තා අත්අඩංගුවට ගෙන නැති අතර, පොලිසිය විසින් දින 10ක් ඇතුළත මේ ගැන සලකා බැලීමට තීරණය කරන ලදී. අපරාධයක වින්දිකයකු හෝ අධිකරණ ක්‍රියාදාමයක සාක්ෂිකරුවකුට පහර දීම හෝ බිය ගැන්නවීම සැලකිය යුතු වරදක් වන අතර, වසර 7 දක්වා සිර දඬුවම් ලබා දිය හැකි බව නීති මූලාශ්‍ර පවසයි. බලධාරීන් විසින් නිසි ක්‍රියාමාර්ග නොගැනීම සිවිල් සහ නෛතික සමාජයේ කෝපයට සහ චකිතයට හේතු වී ඇත[23].

---

[21] http://www.dailymirror.lk/146306/Brigadier-Priyankara-Fernando-arrives-(Accessed on 22nd of July 2018)

[22] http://www.lankabusinessonline.com/tamil-group-urges-action-on-sri-lankan-brigadier-priyanka-fernando/ (Accessed on 22nd of July 2018)

[23] http://www.dailynews.lk/2018/02/13/local/142676/man-attacks-female-lawyer-inside-court-complex(Accessed on 22nd of July 2018)

**20.** මහ ඇමැතිවරයාගේ අපයෝජනය හෙළිදරව් කළ විදුහල්පතිවරියට මරණ තර්ජන



(රූපය- සිද්ධියට මුහුණ පෑ විදුහල්පතිනිය, ඡායාරූපය- www.adaderna.lk)

බදුල්ල දෙමළ කාන්තා විද්‍යාලයේ විදුහල්පතිනි බී. බවනි ඌව පළාත් සභා මහ ඇමති චාමර සම්පත් දසනායක විසින් ඔහු විසින් නිර්දේශ කළ ශිෂ්‍යයකු පාසලට ඇතුළත් කර නොගැනීම නිසා දණ ගස්සවනු ලැබූ බැව් ඇය විසින් හෙළිදරව් කරන ලදී. පසුව මාර්තු 18 වැනි ද කොළඹ දී පැවැති මාධ්‍ය සම්මන්ත්‍රණයක දී ඇය හෙළි කළේ තමන්ට මරණ තර්ජනවලට මුහුණ පෑමට සිදු ඇති බවයි. මේ තර්ජන ඇය මෙම සිද්ධිය හෙළි දරව් කළ නිසා සහ බලෙන් දණ ගස්සවනු ලැබීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම නිසා බව විශ්වාස කෙරේ. පොලීසිය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මේ සිද්ධිය සම්බන්ධයෙන් වෙන වෙනම පරීක්ෂණ කර ගෙන යනු ලබයි. මේ අතර දසනායක මහ ඇමැතිතුමා කියා ඇත්තේ තමන්ට විරුද්ධව ඇති පරීක්ෂණ අවසන් වන තුරු ඌව පළාත් අධ්‍යාපන ඇමති ධූරයෙන් තාවකාලිකව ඉවත් වෙන බවයි. කෙසේ වුවත්, විදුහල්පතිතුමිය සහ ගුරු සංගම් කිහිපයක් කීවේ තමන් පැවැත්වෙන පරීක්ෂණ සම්බන්ධයෙන් ඇති දේශපාලන බලපෑම් නිසා ඒ ගැන සෑහීමකට පත් නොවන බවයි[24] [25].

21. එච්අයිවී නිවාරණ ව්‍යාපෘතියට සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධාන සේවකයන්ට ප්‍රහාර

එච්අයිවී නිවාරණ ව්‍යාපෘතියකට සම්බන්ධ වූ රාජ්‍ය නොවන සංවිධානයක සේවකයන් කණ්ඩායමකට ගම්වැසියන් විසින් පොලිසිය සහ මාධ්‍ය බලා සිටිය දී මාර්තු 18 වැනි දින ගාල්ලේ දී පහර දී ඇත. වින්දිතයන් ආරක්ෂා කිරීමට පොලිසිය විසින් ක්‍රියාමාර්ග ගෙන නැත. ඇතැම් ගම්වැසියන් විසින් මෙම ව්‍යාපෘතිය තරුණයන්ට වඳ බෙහෙත් ලබා දෙන ව්‍යාපෘතියක් ලෙස වැරදි ලෙස අර්ථ දක්වා ඇත. මේ ව්‍යාපෘතිය ගෝලිය අරමුදල (ඒඩ්ස්, ටියුබකියුලෝසිස් සහ මැලේරියා මර්දන ගෝලීය අරමුදල) යටතේ ක්‍රියාත්මක කරන එකකි[26].

[24] http://www.adaderana.lk/news/46468/life-threats-to-principal-of-tamil-girls-mv-badulla-(Accessed on 22nd of July 2018)

[25] http://www.hirunews.lk/181499/badulla-female-principal-reveals-her-ordeal(Accessed on 22nd of July 2018)

[26] https://www.youtube.com/watch?v=rPgX1ZWQ3LQ(Accessed on 22nd of July 2018)

## G සංවිධානය වීමේ නිදහස

22. **පවතින නීතියක් සංශෝධනය කර සංවිධානය වීමේ නිදහස සීමා කිරීමේ උත්සාහයන්**

2018 පෙබරවාරි 20 වැනි දින, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) (LDO 32/2011) සංශෝධනය කිරීම සඳහා මර්දනකාරී පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම පනත කෙටුම්පත් කිරීම රහසේ සිදු කරන ලද අතර, කිසිදු අදහස් විමසීමක් සිදු නොකරන ලදී. මෙම කෙටුම්පත විසින් සංවිධානගත වීමේ නිදහසට ඇති අයිතිය කඩ කරන අතර, රාජ්‍ය සහ රාජ්‍ය නොවන යන දෙක අතර ඇති වෙනස බොඳ කරමින්, සිවිල් ව්‍යාපාර සහ කණ්ඩායම් අධීක්ෂණය කිරීමට, විධිමත් කිරීමට, මැදිහත් වීමට රජයට පුළුල් බලතල සපයන අතර, මේවාට සාමාන්‍යයෙන් පොලිසිය සහ අධිකරණය වෙත පමණක් ඇති බලතල ද අයිති වේ. මේ සංශෝධනයට ක්‍රියාකාරීන්ගෙන් පුළුල් විරෝධයක් එල්ල විය. වැඩි වෙන පීඩනය හමුවේ, මෙය ඉදිරිපත් කළ ඇමැතිවරයා විසින්ම අගමැතිවරයා, රජයේ නිලධාරීන් සහ රටේ මේ ගැන සැලකිලිමත් වූ ක්‍රියාකාරීන් සමග පැවැති රැස්වීමක දී මෙය හකුලා ගැනීමට එකඟ විය. අගමැතිවරයා සහ ඇමැතිවරයා ඉල්ලා සිටියේ ක්‍රියාකාරීන් එකතු වී, අමාත්‍යාංශ නිලධාරීන් සමග සහයෝගයෙන් මතු වූ කාරණා සැලකිල්ලට ගනිමින් අලුත් නීතියක් සැකසීමට කටයුතු කරන ලෙසයි [27] [28] [29].

[27] http://www.cpalanka.org/wp-content/uploads/2018/03/CPA-Note-on-VSSO-Amendment-2018-FINAL-2-1.pdf (Last accessed 19th July 2018)

[28] https://groundviews.org/2018/03/22/crippling-civic-organising-mobilising-and-resistance-through-draft-ngo-act-amendment/ (Last accessed 19th July 2018)

[29] https://twitter.com/ManoGanesan/status/978617985156788224 & https://twitter.com/ManoGanesan/status/978618562850910208 (Last accessed 19th July 2018)